සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

| | | |
|---|---|---|
| හින්දු ශිෂ්ටාචාරය I<br>இந்து நாகரிகம் I<br>Hindu Civilization I | 46 S I | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>Two hours |

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පසු පිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, **එහි අංකය** උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි **කතිරයක්** (X) **යොදා දක්වන්න**.

---

**1.** හින්දු නිම්න ශිෂ්ටාචාර යුගයේ පැවතියේ යැයි සලකනු ලබන වන්දනා ක්‍රම ඇතුළත් වරණය කුමක් ද?
(1) පිදිරර් වන්දනාව සහ වීරපත්තිරර් වන්දනාව
(2) පසුපති වන්දනාව සහ තරෛප්පෙන් වන්දනාව
(3) ලිංග වන්දනාව සහ කන්නකි වන්දනාව
(4) යම වන්දනාව සහ ඍෂි වන්දනාව
(5) පසුපති වන්දනාව සහ ඍෂි වන්දනාව

**2.** වේද යුගයේ දී වෛද්‍යවරුන් අතුරෙන් ශ්‍රේෂ්ඨ වෛද්‍යනාදන් ලෙස ප්‍රශංසා ලැබූ දෙවියන් වන්නේ,
(1) රුද්‍රන් ය. (2) වරුණන් ය. (3) ඉන්ද්‍රන් ය. (4) අදිති ය. (5) පූෂන් ය.

**3.** කාන්තාවන්ගේ යහපැවැත්ම පිළිබඳ 'ස්ත්‍රීකර්මානි' යන මන්ත්‍රය ඇතුළත් ග්‍රන්ථය කුමක් ද?
(1) ඍග් වේදය (2) ප්‍රාමණංගල් (3) අතර්ව වේදය
(4) ආරණියකම් (5) මහාභාරතය

**4.** "ශිව දෙවියන් යනු ආදරයයි (අන්බේ ශිවම්)" යනුවෙන් ශිව දෙවියන්ට ප්‍රශංසා කළේ,
(1) උමාපති ශිවාචාරියාර් ය. (2) උයියවන්ද තේවර් ය.
(3) මෙයිකණ්ඩාර් ය. (4) තිරුමූලර් ය.
(5) අරුණන්ති ශිවාචාරියාර් ය.

**5.** සාක්ත ආගමංගල් හඳුන්වන වෙනත් නාමයක් වන්නේ,
(1) තන්දිරංගල් ය. (2) සිරව්දම් ය.
(3) දේවි මාගාත්මියම් ය. (4) ශ්‍රී විද්‍යා ය.
(5) සණ්ඩිකා ය.

**6.** ආගමම් හි ඥානපාදම් විස්තර කරන තේමාව වන්නේ,
(1) අට්ටාංග යෝහංගල් වේ. (2) තුන් ද්‍රව්‍ය (මුප්පොරුල්) පිළිබඳ සත්‍ය වේ.
(3) උත්සවම් වේ. (4) දේවාල නිර්මාණය වේ.
(5) ප්‍රායච්චිත්ත විධි වේ.

**7.** දෙවියන්ව "වේද නාන්ගිනුම් මෙයිපොරුල් ආවදු නාදන් නාමම් නමසිවායවේ...." යනුවෙන් තේවාරම් ගීතිකා මගින් ප්‍රශංසා කළේ,
(1) සුන්දරර් ය. (2) අප්පර් ය.
(3) සම්පන්තර් ය. (4) මනිවාසහර් ය.
(5) කාරෛක්කාල් අම්මෛයාර් ය.

**8.** වේද යුගයේ දෙවිවරුන් අතර අවිර්පාගම් ගෙනයන දේව දූතයා වූ දෙවියන්,
(1) මිත්තිරන් ය. (2) වරුණන් ය. (3) අග්නි ය. (4) සවිතා ය. (5) පර්ජන්යන් ය.

[දෙවැනි පිටුව බලන්න.

**9.** සංකරර් තම න්‍යායයේ ලෝකය සත්‍යයක් නොවේ යන්නට ඉදිරිපත් කළ වාදය වන්නේ,
(1) අවච්චේද වාදයයි. (2) ප්‍රතිබිම්බ වාදයයි.
(3) විවර්ත්ත වාදයයි. (4) අනිර්වචනීයම් ය.
(5) පරිණාම වාදයයි.

**10.** හින්දු දාර්ශනික මූලාශ්‍රයන් හි 'ප්‍රස්ථානතිරයම්' යන්නෙහි ඇතුළත් ග්‍රන්ථ තුනක් වන්නේ,
(1) බ්‍රාහ්මණම්, ආරණ්‍යකම් සහ වේදාංගම් ය.
(2) ඍග්, යාජුර් සහ සාමම් ය.
(3) උපනිෂද්, බ්‍රහ්මසූත්‍ර සහ භගවත්ගීතාව ය.
(4) මහාභාරතය, රාමායණය සහ ශිවරහසියම් ය.
(5) ශ්‍රීභාශ්‍යම්, ශිවානන්ද ලහරි සහ මාණ්ඩූක්‍ය කාරිගෙ ය.

**11.** ශ්‍රී ලංකාවේ ප්‍රකට ස්වයංජනිත වූ ඊශ්වර දේවාලයක් (තාන්තෝන්ඩ්‍රිෂ්වරම්) පිහිටා ඇත්තේ කොහේ ද?
(1) දෙවි නුවර (2) නල්ලූර් (3) තිරුකේදීශ්වරම්
(4) කොක්කඩිචෝලෙ (5) කීරිමලේ

**12.** "තුන් ද්‍රව්‍ය සත්‍ය සහ පස් වාර්ගික බේද ස්ථිරයි" යනුවෙන් සඳහන් කරන දර්ශනය වන්නේ,
(1) තුවෙදම් ය. (2) අත්වෛදම් ය. (3) ශිවාත්තුවිදම් ය.
(4) විශිෂ්ටාත්වෛදම් ය. (5) තුවෛදාත්වෛදම් ය.

**13.** හින්දු ආගමික මූර්තිවල ප්‍රකාශිත විවිධ සංකේතාත්මක තේරුම් පිළිඹිබු කරනු ලබන්නේ,
(1) කෛයමෛදිහල් තුළිනි. (2) ආසන පිහිටීම තුළිනි.
(3) පංග අමෛදිහල් තුළිනි. (4) ඇඳුම් පැළඳුම් තුළිනි.
(5) හිසකෙස් සැරසිලි තුළිනි.

**14.** දේවාල වන්දනාවේදි "ලෝකයේ ජීවත්වන සියලු ජනයා සුවපත් වේවා" යන ආශිර්වාදය ශිවාචාරියාර් තුමා ලබා දෙන්නේ කුමන අවස්ථාවේ ද?
(1) දේවාල නිර්මාණයේදී ය.
(2) දේවාල සේවාවන්හිදී ය.
(3) දෙවියන් සංචාරයේ යෙදෙන අවස්ථාවේදී ය.
(4) දෙවියන්ට කරනු ලබන පූජා පිළිවෙත් අවසානයේදී ය.
(5) දෙවියන්ට ආහාර යනාදිය (නෛවේත්තියම්) පූජා කිරීමේදී ය.

**15.** ශිවාගමම්හි කිරියාපාදම් විස්තර කරන 'ප්‍රායච්චිත්තම්' යන්න කුමක් සංකේතවත් කරන්නේ ද?
(1) දේවාලයේ සිදුවන වැරදි නිරාකරණය (2) ගිනි දැල්වීම
(3) අභිෂේක කිරීම (4) යාග පූජා
(5) දෙවියන්ට අදාළ උත්සව

**16.** 'ශිවඥානපෝදම් පදනම් කොටගත් ග්‍රන්ථය' යනුවෙන් ප්‍රශංසා ලබන සිද්ධාන්ත ශාස්ත්‍ර ග්‍රන්ථය වන්නේ,
(1) තිරුවුන්දියාර් ය. (2) තිරුකලිට්‍රුප්පඩියාර් ය.
(3) ශිවඥානසිත්තියාර් ය. (4) උන්මෛනෙරි විලක්කම් ය.
(5) සංගර්ප නිරාකරනම් ය.

**17.** කුලක්කෝට්ටන් රජතුමා තිරුකෝණේශ්වරම් දේවාලයේ කළ දේවාල සේවා පිළිබඳව දැනගැනීමට උපකාරී වන සාක්ෂිය කුමක් ද?
(1) චූල වංශය (2) පදවිය සෙල්ලිපිය
(3) තිරුකරසෙ පුරාණම් (4) තට්සනකෛලාය පුරාණම්
(5) ශ්‍රී කෛලාසනාථ පුරාණම්

**18.** දේවාල ගොඩනැගිලි ශාස්ත්‍රානුකූලව ඉදිකිරීමේ ප්‍රවීණයා හඳුන්වනු ලබන්නේ,
(1) පුරෝහිදන් වශයෙනි. (2) මූර්ති ශිල්පියා වශයෙනි.
(3) සූත්‍ර කිරාකි වශයෙනි. (4) වර්තකි වශයෙනි.
(5) ස්තපති වශයෙනි.

**19.** හලාවත ශ්‍රී මුන්නේශ්වරම් දේවාලයේ මුන්නෛනාතර් සුවාමි සමඟ වැඩ වාසය කරනු ලබන අම්බාල් වනුයේ,
(1) ශ්‍රී වඩිවාම්බිකෛ (2) පාර්වති අම්බාල් (3) ගෞරි අම්බාල්
(4) මාදුමෛයාල් (5) කමලාම්බිහෛ

**20.** දකුණු ඉන්දියානු ශෛව ආගමික සම්ප්‍රදායේ දෙවියන්ට මිත්‍රයෙකු සේ සලකා මිත්‍රකමින් වන්දනා කළ නායනාර් වන්නේ,
(1) කණ්ණප්පර් ය. (2) සුන්දරර් ය. (3) පූසලාර් ය.
(4) සිරුත්තොණ්ඩර් ය. (5) අප්පර් ය.

**21.** චෝල යුගයේ තංජාවූර් මහා දේවාලය හැඳින්වූයේ
(1) තෝනිපුරත්තීසර් දේවාලය යනුවෙනි. (2) තිරුවීරට්ටානේශ්වරර් දේවාලය යනුවෙනි.
(3) ඒගාම්බරේශ්වරර් දේවාලය යනුවෙනි. (4) තෙන්තිසෛමේරු යනුවෙනි.
(5) කෛලාසනාදර් දේවාලය යනුවෙනි.

**22.** මාමල්ලපුරම් ගණේශනාදර් සෙල්ලිපිය මගින් තම දැඩි ශිව භක්තිය ප්‍රකාශ කළ රජතුමා වන්නේ,
(1) දෙවන නරසිම්හවර්මන් ය. (2) පරමේශ්වර රජතුමා ය.
(3) මහේන්ද්‍රවර්මන් ය. (4) නන්දිවර්මන් ය.
(5) සිම්මවිෂ්ණු ය.

**23.** යාපනයේ රාජ්‍යයේ ආර්ය චක්‍රවර්තීන්ගේ යුගයේ ප්‍රකාශනයට පත්වූ ග්‍රන්ථවලින් එකක් වන්නේ
(1) ශෛව සමය චින්තාමනි ය. (2) නඩරාජ වඩිවම් ය.
(3) ශෛව දූෂණය පරිහාරම් ය. (4) ඥානරත්නාවලි ය.
(5) සරසෝදිමාලෛ ය.

**24.** ශිව දේවාලයන්හි විමානකෝෂ්ඨයන්හි වැඩසිටි දෙවිවරුන් තුන්දෙනෙකුගේ නම් ඇතුළත් වරණය කුමක් ද?
(1) ලිංගෝට්පවර් දක්ෂණාමූර්ති සහ බ්‍රහ්මන් ය.
(2) මහාවිෂ්ණු, බ්‍රහ්ම සහ චන්ද්‍රසේකර ය.
(3) ලිංගෝට්පවර්, බ්‍රහ්මන් සහ කාලාරි ය.
(4) තිරිපුරාන්තකර්, දක්ෂණාමූර්ති සහ විෂ්ණු ය.
(5) උමාමහේශ්වරර්, අර්ධනාරීශ්වරර් සහ සෝමාස්කන්දර් ය.

**25.** හින්දු සංස්කෘතියේ දැනුම වර්ධනය සඳහා වඩමොලි ඉලක්කිය වරලාරු සහ ශෛව තිරුක්කෝයිට් කිරියෛ නෙරි යන ග්‍රන්ථ ප්‍රකාශයට පත්කළ ශ්‍රී ලාංකීය විද්වතා වන්නේ,
(1) මහාචාර්ය කා. කෛලාසනාථ කුරුක්කල් ය.
(2) කාසිවාසි සෙන්දිනාදෛයර් ය.
(3) අරුණාසල තේසිකර් ය.
(4) සුවාමි ඥානප්‍රකාශර් ය.
(5) මහාචාර්ය ක. කෛලාසපති ය.

**26.** "මා මරණයේ සිට නොමැරෙන තත්ත්වයට ගෙනයනු මැනවි" යන ප්‍රාර්ථනාව සඳහන් වන ග්‍රන්ථය වන්නේ,
(1) මහාභාරතය ය. (2) බෘහධාරණ්‍යක උපනිෂද් ය. (3) රාමායණය ය.
(4) සුක්‍රනීති ය. (5) තෛත්‍රිය උපනිෂද් ය.

**27.** අත්වෛද න්‍යායයේ යතුර ලෙස පිළිගැනෙන, ගෞඩපාදර් විසින් රචිත ග්‍රන්ථය වනුයේ,
(1) බ්‍රහ්මසූත්‍රය ය. (2) මාණ්ඩූක්‍ය කාරිගෛ ය.
(3) විවේග සූඩාමනි ය. (4) වේදාන්ත සංකිරහම් ය.
(5) වේදාන්ත තීබම් ය.

**28.** සංකරර් විසින් ඉටුකළ වැදගත් සේවා අතුරෙන් එකක් වන්නේ
(1) දේවාල සේවාවයි. (2) බැතිමතුන්ට සේවාව සැලසීමයි.
(3) වේදාන්ත මඩම් නිර්මාණය කිරීමයි. (4) පූජාවන් සඳහා මල් නෙලීමයි.
(5) දේවාල ඉදිකිරීම් කටයුතුයි.

**29.** ශෛව ජනයාට ශෛව ආගමේ ආධ්‍යාත්මික මාර්ගය ගුරු ගෝල සම්ප්‍රදාය පදනම් කරගෙන ග්‍රන්ථ මගින් පැහැදිලි කරන ලද්දේ
(1) සිවාචාරියාර්වරුන් විසිනි. (2) දේවාල භාරකරුවන් විසිනි.
(3) චන්තාන කුරවර්ලා විසිනි. (4) භක්ති ගීත ගයන්නන් විසිනි.
(5) පුරාණ පඨනකාරර්ලා විසිනි.

**30.** මෙයිකණ්ඩ ශාස්ත්‍ර දහහතර අතුරින් ප්‍රධාන වන්නේ,
(1) ශිවඥානපෝදම් ය. (2) ශිවප්‍රකාසම් ය.
(3) උන්මෛ විලක්කම් ය. (4) නෙන්ජුවිඩු තූදු ය.
(5) තිරුකලිට්ඨප්පාඩියාර් ය.

**31.** සංග සාහිත්‍ය ජනතාවට උපදේශනය කරන එලදායි ප්‍රකාශය කුමක් ද?
(1) එන් කඩන් පනි සෙයිදු කිඩප්පදේ (2) යාදුම් ඌරේ යාවරුම් කේලීර්
(3) නමසිවාය වාල්හ; නාදන් තාල් වාල්හ (4) ගොපුර දරිසනම් කෝඩි පුණ්ණියම්
(5) පෙට්ට්‍රොරෙර පේනු

**32.** 'ඉන්දීය වෙදකමේ පියා' යනුවෙන් ප්‍රසංසා ලබන්නේ,
(1) වරාහමිහිර ය. (2) ආරියභට්ට ය. (3) තන්වන්දිරි ය.
(4) ලාඩ දේව ය. (5) බ්‍රහ්මගුප්ත ය.

**33.** තමිල්නාඩුවේ වෛෂ්ණව ආගම වර්ධනය කිරීම සඳහා ආල්වාර්ලා සිදු කළ ප්‍රධාන මෙහෙවරයක් ලෙස සැලකෙන්නේ,
(1) දේවාල සේවා ය.
(2) පුරාණ පඨනම් කිරීම ය.
(3) දේවාල ඉදිකිරීම්වලට උපකාරී වීම ය.
(4) කෝවිල භාවනාවේ යෙදීම ය.
(5) තිරුමාල් දෙවියන්ට දමිල භාෂාවෙන් ස්තෝත්‍ර ගයමින් භක්තිය වර්ධනය කිරීම ය.

**34.** හින්දු භක්තිකයන්ගේ දේශපාලන, ආර්ථික මත පිළිබඳ විස්තර ලබා ගත හැකි ග්‍රන්ථය වන්නේ,
(1) කෛවල්‍ය නවනීදම් ය. (2) පරාසරස්මිරුදි ය.
(3) අර්ථ ශාස්ත්‍රය ය. (4) ඥානාමිර්දම් ය.
(5) මානසාරම් ය.

**35.** ශ්‍රී ලංකාවේ පොළොන්නරුව යුගයේ දේවාලවල සොයාගනු ලැබූ ලෝහ මූර්තිවලින් දෙකක් ඇතුළත් වරණය කුමක් ද?
(1) සන්ඩේසුවරර් සහ භෛරවර් ය
(2) නඩරාජර් සහ සෝමාස්කන්දර් ය
(3) කාරෛක්කාල් අම්මෛයාර් සහ දක්ෂණාමූර්ති ය
(4) ශන්මුගර් සහ තිරිපුරාන්තහර් ය
(5) කන්නගි සහ ත්‍රිවිඛදී ය

**36.** මූර්ති කලා සම්ප්‍රදායේ මූර්ති ශිල්පියා උච්චාරණය කරන ධ්‍යාන මන්ත්‍රවල ප්‍රයෝජනය වන්නේ,
(1) මූර්ති ප්‍රමාණවලට අනුව සාම්ප්‍රදායිකව නෙලීම ය.
(2) තමන් සමඟ සේවය කරන්නන්ට යහපතක් ලැබීම ය.
(3) සමාජයට යහපතක් ලැබීම ය.
(4) ආකර්ෂණීය හැඟීම් ඇති කිරීම ය.
(5) තමන්ට යහපතක් ලැබීම ය.

**37.** ගුප්ත යුගයේ දේවාල ගෘහ නිර්මාණ කලාවේ ප්‍රධානතම ශෛලිය වන්නේ,
(1) නාගර ශෛලියයි. (2) වේශර ශෛලියයි.
(3) ද්‍රවිඩ නාගර ශෛලියයි. (4) නාගර වේශර ශෛලියයි.
(5) ද්‍රවිඩ ශෛලියයි.

**38.** "ඕසෛ ඔලි එලාම් ආනායි..." යනුවෙන් දෙවියන්ට ප්‍රශංසා කර සංගීත කලාව වර්ධනය කරන ලද්දේ,
(1) සේක්කිලාර් විසිනි. (2) නම්බියාණ්ඩාර් නම්බි විසිනි.
(3) අප්පර් විසිනි. (4) සුන්දරර් විසිනි.
(5) තිලකවදියාර් විසිනි.

**39.** ගින්න සංකේතාත්මක කරමින් ශිව දෙවියන් වන්දනා කරනු ලබන තමිල්නාඩුවේ පිහිටි දේවාලය
(1) තිරුවෛයාරු ය. (2) චිදම්බරම් ය.
(3) තිරුත්කාලත්ති ය. (4) තිරුවන්නාමලෛ ය.
(5) තිරුක්කඩවූර් ය.

**40.** 'පස්වන වේදය' යනුවෙන් ප්‍රශංසා කරනු ලබන්නේ,
(1) ධර්මශාස්ත්‍ර ය. (2) වේදාංගම් ය.
(3) මහාභාරතය ය. (4) වෛෂ්ණව ආගමම් ය.
(5) කෘහ්‍ය සූත්‍ර ය.

[පස්වැනි පිටුව බලන්න.

- අංක **41** සිට **45** තෙක් එක් එක් ප්‍රශ්නයේ දී ඇති ප්‍රකාශ කියවා, ඒවාට සුදුසු පිළිතුරු පහත වගුවේ සඳහන් **I, II, III, IV** යන තීරුවලින් තෝරන්න.

| I | II | III | IV |
|---|---|---|---|
| A<br>වේදාන්ත න්‍යාය පැහැදිලි කරයි | F<br>ආගමික දේශනා මගින් ආගමික දැනුවත් කිරීම | K<br>වැඩිහිටියන්ව අගය කිරීම | P<br>දේවාලවල පුරසාරම් පවසයි. |
| B<br>අනුන්ගේ යහපත සැලසීම | G<br>ශිව දෙවියන්ගේ දේව පුරසාරම් පවසයි | L<br>සෙල් ලිපි | Q<br>සංගීතය සහ භක්ති ගීත (පන්නිසෛ) ප්‍රසංගය |
| C<br>ආගමික උත්සවවල සජීවී විකාශනය | H<br>ආගන්තුක සත්කාරය | M<br>'නමසිවාය' යන මන්ත්‍රය අගය කරයි. | R<br>දෙවියන්ට ලඟා වී සිටීම |
| D<br>පුරා විද්‍යාත්මක සංකේත | I<br>අවතාර න්‍යාය පැහැදිලි කරයි | N<br>ආගමික විද්වතුන් සමඟ සම්මුඛ පරීක්ෂණ | S<br>සත්‍ය පැවසීම |
| E<br>සංගීතමය බව | J<br>සාහිත්‍යමය සාක්ෂි | O<br>කර්ම යෝගය | T<br>විදේශිකයන්ගේ සටහන් |

**41.** මහජනයා මෙලොව යහපත් ජීවිතයක් ගත කිරීම සඳහා හින්දු ආගම ලබාදෙන දේශන ඇතුළත් කාණ්ඩය කුමක් ද?
(1) A, G, L, T (2) B, H, K, S (3) C, H, O, T (4) D, J, K, P (5) E, H, N, R

**42.** භගවත්ගීතාවේ සුවිශේෂතා ඇතුළත් කාණ්ඩය කුමක් ද?
(1) A, I, O, R (2) B, J, L, S (3) C, F, K, T (4) D, I, L, Q (5) D, G, M, S

**43.** හින්දු සංස්කෘතිය ජනතාව අතරට ගෙනයන මාධ්‍යවල ක්‍රියාකාරකම් ඇතුළත් කාණ්ඩය කුමක් ද?
(1) B, H, M, Q (2) C, F, N, Q (3) D, H, K, P (4) E, J, O, S (5) E, J, L, T

**44.** හින්දු ශිෂ්ටාචාර ඉතිහාසය දැන ගැනීමට උපකාරී වන මූලාශ්‍ර ඇතුළත් කාණ්ඩය කුමක් ද?
(1) A, G, O, R (2) B, H, L, S (3) C, H, K, T (4) C, F, O, R (5) D, J, L, T

**45.** නායන්මාර්ලාගේ දේව ගීතිකාවල ප්‍රයෝජන ඇතුළත් කාණ්ඩය කුමක් ද?
(1) B, H, K, S (2) C, F, K, T (3) D, H, L, T (4) E, G, M, P (5) E, F, M, Q

- අංක **46** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට අදාළ ව කිසියම් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් දී ඇත. ඒවායින් මාතෘකාව හා **නොගැළපෙන** කරුණ තෝරන්න.

**46. හින්දු කලාවේ සුවිශේෂත්වය**
(1) කලාව යනු යෝග මාධ්‍යයක් යනුවෙන් සඳහන් කරනු ලබයි.
(2) කලාව යනු ප්‍රමාණ සුදුසුභාවය සමගින් නීතිරීතිවලට අවනත වීමයි.
(3) කලා හැඟීම මගින් භක්තිකයා මිනිස් තත්ත්වයේ සිට දේව තත්ත්වයට උසස් කරයි.
(4) ශ්‍රී ලංකාවේ විද්වතුන් කිසිවෙක් හින්දු කලා න්‍යාය පිළිබඳ ග්‍රන්ථ ප්‍රකාශනයට පත් කළේ නැත.
(5) කලා පළපුරුද්ද මගින් මානසික ඒකාග්‍රතාවය හා ආධ්‍යාත්මික සතුට ලැබෙයි යනුවෙන් පැවසේ.

**47. ධර්මශාස්ත්‍ර සහ මානව වර්ගයාගේ වර්ධනය**

(1) ධර්මශාස්ත්‍ර 'ස්මිරුදි' යන නමින් හඳුන්වනු ලබයි.

(2) මානව ජීවිතය පිළිබඳ ඉපැරණි ග්‍රන්ථ වන්නේ ධර්මශාස්ත්‍ර ය.

(3) ධර්මශාස්ත්‍ර ආශ්‍රම ධර්ම, රාජ ධර්ම, නීතිය සහ යුක්තිය පරිපාලනය පිළිබඳ විස්තර කරයි.

(4) ධර්මශාස්ත්‍ර තනි පුද්ගලයාට සහ සමාජයට සුදුසු දෛනික ජීවන චර්යාවන්ට අදාළ නීති පිළිබඳව විස්තර කරයි.

(5) නාරදර් යන අයගේ ධර්මශාස්ත්‍රවල කාන්තා අයිතිවාසිකම් පිළිබඳ කරුණුවලට වැඩි වැදගත්කමක් නොදේ.

**48. හින්දු සංස්කෘතියේ රාමායණයේ උසස් බව**

(1) හින්දි භාෂාවෙන් තුලසි රාමායණය ලියනු ලැබීය.

(2) කම්බර් විසින් දමිළ භාෂාවෙන් කම්බරාමායණම් රචනා කරනු ලැබීය.

(3) රාමායණයේ ආදි කවියා ලෙස ව්‍යාසර් ගෞරවයට පාත්‍ර වේ.

(4) සංස්කෘත භාෂාවෙන් ලියවුණු රාමායණය ඉදිහාසම්වලින් එකකි.

(5) රාමායණය හින්දු භක්තිකයන්ගේ ජීවන අධ්‍යාත්මයන්ට පාදක වී පවතී.

**49. දහනවවන සියවසේ ශ්‍රී ලංකාවේ හින්දු සංස්කෘතිය**

(1) මෙම කාලයේ ජනතාව අතරට හෛරව වන්දනාව ප්‍රචලිත වී තිබිණි.

(2) වෙනත් ආගම්වල ආභාසය මෙම කාලය තුළ පැවති හෙයින් ශෛව ආගම පසුබෑමකට ලක්විය.

(3) ශ්‍රී ලාංකේය ඉතිහාසයේ 19 වන සියවස් යුගය විදේශිකයන්ගේ පාලන සමයයි.

(4) මෙම කාලයේ ශෛව ආගම රැක ගැනීම සඳහා ආගමික නායකයින් බොහොමයක් කැපවීමෙන් ක්‍රියා කලහ.

(5) ජනතාව අතර ආගමික දැනුම ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම කාල සීමාව තුළ මුද්‍රණ යන්ත්‍රශාලා ආශ්‍රිත පහසුකම් නැතිවීම මහත් අඩුවකි.

**50. හින්දු භක්තිකයන් විද්‍යාවෙන් ලබාගත් හැකියාවන් පිළිබිඹු කරන තාරකා විද්‍යාත්මක සිතුවිලි**

(1) පුරාණ තාරකා විද්‍යාත්මක න්‍යායන් බිහිකර ඇතැයි සඳහන් කළ හැක.

(2) තාරකා විද්‍යාව සහ ජ්‍යොතිෂය පිළිබඳ අදහස් ජන ජීවිත වර්ධන කරයි.

(3) ඉන්දීය තාරකා විද්‍යාඥයන් ග්‍රහණ පිළිබඳ හේතුව දැන සිටියේ නැත.

(4) පුරාණ ඉන්දිය ජාතිකයන් තාරකා විද්‍යාව පිළිබඳ කරුණුවල දැනුමෙන් පරිපූර්ණ අය වේ.

(5) ඉන්දීය තාරකා විද්‍යාඥයන්ගෙන් I වන ආරියභට්ටර් තාරකා විද්‍යාව පිළිබඳ විද්වතෙකි.

* * *

0283

[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

හින්දු ශිෂ්ටාචාරය II
இந்து நாகரிகம் II
Hindu Civilization II

46 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස් :**

※ **I** කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, **II** කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

**1.** හින්දු සංස්කෘතිය වර්ධනය කිරීමහිලා මහා පුරාණංගල්හි වැදගත්කම පහත සඳහන් මාතෘකා ඇසුරෙන් විස්තර කරන්න.

(අ) පුරාණංගල්හි ව්‍යුහය

(ආ) පුරාණංගල්හි වර්ගීකරණය

(ඉ) පුරාණංගල් විස්තර කරන වන්දනා ක්‍රම

(ඊ) පසුකාලීන සංස්කෘතික වර්ධනයෙහිලා පුරාණංගල්හි වැදගත්කම

(ලකුණු 5 × 4 = 20යි.)

**2.** පල්ලව යුගයේ දී තමිල්නාඩුවේ දේවාල වාස්තු විද්‍යාවේ ඇති වූ ක්‍රමානුකූල වර්ධනය පහත සඳහන් මාතෘකා ඇසුරෙන් පැහැදිලි කරන්න.

(අ) වාස්තු විද්‍යාත්මක වර්ධනයට රජවරුන්ගේ දායකත්වය

(ආ) කුඩෛතලිහල්

(ඉ) මලෛතලිහල්

(ඊ) කට්ටුත්තලිහල්

(ලකුණු 5 × 4 = 20යි.)

**3.** ශ්‍රී ලාංකීය හින්දු සංස්කෘතික වර්ධනයට ස්වාමි විපුලානන්දගේ දායකත්වය පහත සඳහන් මාතෘකා ඇසුරෙන් විස්තර කරන්න.

(අ) ජීවිතය පිළිබඳ හැඳින්වීම

(ආ) ආගමික සේවා

(ඉ) අධ්‍යාපනික සේවා

(ඊ) කලා සේවා

(ලකුණු 5 × 4 = 20යි.)

[දෙවැනි පිටුව බලන්න.

## II කොටස

**4.** වේදාන්ත දාර්ශනික වර්ධනයේ රාමානුජර්ගේ විශිෂ්ටාත්වෛද සංකල්පයේ සුවිශේෂතා පහත සඳහන් මාතෘකා ඇසුරින් පැහැදිලි කරන්න.

(අ) 'විශිෂ්ටාත්වෛදම්' යන වචනයේ තේරුම පැහැදිලි කිරීම (ලකුණු 2යි)

(ආ) ඊශ්වරන් (ලකුණු 6යි)

(ඉ) ආත්මය (ලකුණු 6යි)

(ඊ) ආත්ම විමුක්තිය ලබා ගැනීම සඳහා වූ මාර්ග (ලකුණු 6යි)

**5.** ශෛව සිද්ධාන්ත දාර්ශනික සම්ප්‍රදායේ ආත්මය පිළිබඳ මතය, ආත්මයේ ගති ලක්ෂණ, ජීවායේ පරමාර්ථ ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 20යි)

**6.** හින්දු භක්තිකයන්ගේ ජීවන රටාවේ සදාචාරාත්මක බවෙහි (අරම්) වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 20යි)

**7.** හින්දු විද්‍යාත්මක සම්ප්‍රදායේ ඇති වෛද්‍ය කලාවේ විශේෂතා විස්තර කරන්න. (ලකුණු 20යි)

**8.** පුරාණයේ හින්දු ප්‍රජාව විසින් පෝෂණය කරමින් වර්ධනය කරන ලද අධ්‍යාපනික සම්ප්‍රදාය පිළිබඳව එහි අරමුණු සහ අධ්‍යාපන ක්‍රම ඇසුරින් පහදන්න. (ලකුණු 20යි)

***

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

| | | |
|---|---|---|
| ඉස්ලාම් ශිෂ්ටාචාරය I<br>இஸ்லாமிய நாகரிகம் I<br>Islamic Civilization I | 47 S I | *පැය දෙකයි*<br>*இரண்டு மணித்தியாலம்*<br>*Two hours* |

**උපදෙස්:**

※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
※ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
※ උත්තර පත්‍රයේ පසුපිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
※ **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

**1.** ඉස්ලාම් නීතියේ 'රබ්බානියියා' යන්නෙහි අර්ථය කුමක් ද?
(1) පූර්ණත්වය (2) දේවත්වය
(3) යුක්තිය හා සාධාරණත්වය (4) යථාර්ථය
(5) පොදු ලක්ෂණයක්

**2.** අල්-කුර්ආනය සම්පාදනය කිරීමෙහි සම්බන්ධ වූ නබිතුමාගේ සහාබාවරුන් දෙදෙනෙකු සඳහන් වරණය තෝරන්න.
(1) උමර් (රළි) - මුස්අබ් බින් උමෛර් (රළි)
(2) සයිද් බින් සාබිත් (රළි) - මුආද් බින් ජබල් (රළි)
(3) අබූබක්ර් (රළි) - අබ්දුල් රහ්මාන් බින් අව්ෆ් (රළි)
(4) උමර් (රළි) - හුදෛබතුල් යමානි (රළි)
(5) උස්මාන් (රළි) - සඅද්බින් අබී වක්කාස් (රළි)

**3.** 'ඉබාරතුන්නස්' යනු,
(1) නීතිය හා සම්බන්ධ වූ සම්මතයන් ය.
(2) අල්-කුර්ආන් වදන්වලට නීති අර්ථදැක්වීම් ය.
(3) පැහැදිලි නීතීන් ය.
(4) නීති ප්‍රකාශවලින් ලබාගන්නා විනිශ්චයන් ය.
(5) අල්-කුර්ආන් නීති වදන් පැහැදිලි කරන හදීස් ප්‍රකාශයන් ය.

**4.** ඉස්ලාම් ශිෂ්ටාචාරයේ මූලධර්මවලින් ප්‍රධාන එකක් වනුයේ,
(1) මුහාසබා යන ස්වයං විමර්ශනයයි.
(2) මුනාජාත් යන දේවත්ව සබඳතාවයයි.
(3) සුහ්ද් යන ශ්‍රමණ ජීවිතයයි.
(4) මආද් පිළිබඳ විශ්වාසයයි.
(5) ඉමාරත් ක්‍රියාවයි.

**5.** පහත අයගෙන් ශ්‍රී ලංකාවේ ඉස්ලාම් හඳුන්වාදීමේ කාර්යයෙහි සම්බන්ධ වූ නබිතුමාගේ සහාබි වන්නේ,
(1) සඅද් බින් අබි වක්කාස් (රළි) වේ.
(2) වහබ් බින් අබි කබ්ෂා (රළි) වේ.
(3) අබ්දුල් රහ්මාන්-බින් අබී බක්ර් (රළි) වේ.
(4) මුආවියා බින් අබී සුෆ්යාන් (රළි) වේ.
(5) ජඃෆර් බින් අබී තාලිබ් (රළි) වේ.

**6.** දේශ ගවේෂක ඉබන් බතූතා තුමා ශ්‍රී ලංකාවේ සංචාරය කළ ශතවර්ෂය,
(1) 12 වන ශ.ව. (2) 13 වන ශ.ව. (3) 14 වන ශ.ව. (4) 15 වන ශ.ව. (5) 16 වන ශ.ව.

[දෙවැනි පිටුව බලන්න.

**7.** පහත ප්‍රකාශ කෙරෙහි අවධානය යොමු කරන්න.

A - පරලොවෙහිදී කිසිවෙකුටත් අල්ලාහ් දැකගත නොහැකි ය.

B - අල්ලාහ්ගේ zසාද් සහ සිෆාත් එකිනෙකට වෙනස් ය.

ඉහත ප්‍රකාශයන් හා සම්බන්ධ වූවන් පිළිවෙළින්,

(1) මුඃතසිලාවරු - මුර්ජිආවරු වේ.
(2) අෂ්-අරියියාවරු - මුර්ජිආවරු වේ.
(3) කාරිජ්වරු - අෂ්-අරියියාවරු වේ.
(4) ෂිආවරු - කාරිජ්වරු වේ.
(5) මුඃතසිලාවරු - අෂ්-අරියියාවරු වේ.

**8.** 'ශ්‍රී ලංකා යෝනකයින්ගේ ඉතිහාසය පිළිබඳ විමර්ශනයක්' යන ග්‍රන්ථයේ අන්තර්ගතය,

(1) එක් ජන වර්ගයක ඉතිහාසය, ගති පැවතුම් හා සම්ප්‍රදායන්ගෙන් නොව ලේ ඥාතීත්වය තුළින් නිර්ණය කළ හැකි ය.
(2) ශ්‍රී ලංකා මුස්ලිම්වරු දකුණු ඉන්දීය මුස්ලිම්වරුන්ගෙන් පැවත එන්නන් ලෙස ය.
(3) යුරෝපීයයන් ශ්‍රී ලංකාවට පැමිණීමට පෙර මුස්ලිම්වරු ශ්‍රී ලංකාවේ ස්ථිර ජනාවාස පිහිටුවාගෙන සිටියහ යන්න ය.
(4) ආරම්භයේ සිටම ශ්‍රී ලංකාවේ වෙරළ තීරයේ සහ අභ්‍යන්තරයේ ජීවත් වෙමින් සිටියහ යන්න ය.
(5) මහනුවර රාජ්‍ය තුළ මුස්ලිම්වරු නොයෙක් දෙපාර්තමේන්තුවල සේවකයන් ලෙසත් අධීක්ෂකයන් ලෙසත් සේවයෙහි යෙදුනහ යන්න ය.

**9.** 'ධර්මයෙහි බලකිරීමක් නැත' යන අල්-කුර්ආන් වදන හඟවන අර්ථය,

(1) ආගමික කටයුතුවල එකඟතාවන්ට පැමිණිය හැකි තත්ත්වයක් පවතී.
(2) මිනිසුන් සියලුදෙනාම නීතිය ඉදිරියේ සමානව සැලකිය යුතු ය.
(3) කිසිවෙකුට තමා අනුගමනය කරන ප්‍රතිපත්ති තව කෙනෙකුට බලකිරීමට නොහැකි ය.
(4) ආගම්, භාෂා, සංස්කෘතීන් ආදිය දිව්‍යමය අධිෂ්ඨානයන් ය.
(5) ආගමික විශ්වාස කැමති ආකාරයට වෙනස් කරගැනීමේ හැකියාව පවතී.

**10.** 'අර්රයිහානි' යනු,

(1) ප්‍රතිකාර ක්‍රමයකි. (2) ස්වර්ගයන්ගෙන් එකකි.
(3) සංගීත භාණ්ඩයක නමකි. (4) අරාබි අක්ෂර කලාවකි.
(5) කාව්‍ය ක්‍රමයකි.

**11.** නබි මුහම්මද් (සල්) තුමා මදීනාවට පැමිණි විට ප්‍රමුඛතාවය දුන් ක්‍රියා තුනක් පිළිවෙළින්,

(1) මුස්ලිම්වරුන්ගේ ආරක්ෂාව, යුද්ධයට සූදානම් වීම, දඃවා ප්‍රසාරණය ආදිය වේ.
(2) මස්ජිද් ඉදිකිරීම, සහෝදරත්වය ඇති කිරීම සහ මදීනා ශාසනය වේ.
(3) මස්ජිද් ඉදිකිරීම, ළමා අධ්‍යාපනය, අසල්වැසි රටවල් හා සබඳතාවය වේ.
(4) දඃවා ප්‍රසාරණය, වහලුන් නිදහස් කිරීම, යුද්ධයට සූදානම් වීම වේ.
(5) සහෝදරත්වය ඇති කිරීම, ආර්ථික අභිවෘද්ධිය, මදීනා ශාසනය ආදිය වේ.

**12.** ඉස්ලාම් ශිෂ්ටාචාරයෙහි විශේෂ ලක්ෂණ ලෙස පිහිටනුයේ,

(1) මුස්ලිම් බහුතරය වූ සමාජය පමණක් ඉලක්ක කරගැනීම වේ.
(2) ආධ්‍යාත්මික කරුණුවලට පමණක් අවධාරණය යොමුකිරීම වේ.
(3) තදබල නීතිමය නියමයන්ගෙන් සීමා කරන ලද්දක් වේ.
(4) ලෞකික කරුණුවලට අවධානය යොමු කිරීම වේ.
(5) ජීවිතයට මගපෙන්වීම සඳහා වහි සහ තර්කාන්විතභාවය ආධාරකොට ගෙන තිබීම වේ.

**13.** අල්-කුර්ආන් වදන් එකලස් කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කරනු ලබන ආකාරයට උමර් (රලි) තුමා ඉදිරිපත් කළ සාධාරණීකරණය,

(1) අල්-කුර්ආනයට සහ මුස්ලිම්වරුන් අතර බැඳීම බිඳී යා හැකිය යන හීතිය.
(2) වැඩිමල් සහාබිවරුන් ඉදිරියේ අල්-කුර්ආන් සම්පාදනයට යෝග්‍ය වේය යන මතය.
(3) සහාබිවරුන් අතර පුද්ගලිකව තිබූ අල්-කුර්ආන් වදන්වල ලේඛන පිටපත් විනාශ වී යා හැකිය යන බිය.
(4) අල්-කුර්ආන් කටපාඩම් කර සිටි හාෆිල්වරු ගැටුම්වලදී මියගොස් තිබීම.
(5) සයිද් බින් සාබිත් (රලි) තුමා ජීවතුන් අතර සිටියදී අල් කුර්ආනය එකළස් කිරීම යෝග්‍ය වේය යන පිළිගැනීම.

0283

**14.** පහත සඳහන් ප්‍රකාශවලින් වහි හා සම්බන්ධ වූ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) හදීස් කුද්සි ද 'වහියුන් මත්ලුව්වුන්' යන පාරායනය කරන ලද වහියට අයත් වේ.
(2) නබිවරුනට සහ රසූල්වරුනට පමණක් අල්ලාහ් වහි පහළ කළේ ය.
(3) අල්ලාහ් වහි පහළ කරන විට එයට සාක්ෂි ලෙස මලක්වරුන් පත් කළේ ය.
(4) මුජ්තහිද්වරුන්ටත් වහි මගින් මගපෙන්වීම් ලබාදී ඇත.
(5) අල්ලාහ් අධ්‍යාත්මික බලය සහිත පුද්ගලයින්ට වහි පහළ කළේ ය.

**15.** ඉස්ලාමික චින්තනය ආරක්ෂා කිරීම යන විෂයෙහිදී ඉමාම් සිර්හින්ද් (රහ්) තුමාගේ විරෝධතාවයට ලක් වූ පාලකයා,
(1) අක්බර් රජු
(2) කලීෆා මුතවක්කිල්
(3) හුමායුන් රජු
(4) කලීෆා හිෂාම්
(5) සාහ්ජහාන් රජු

**16.** "ලෝකය සූර්යයා වටේ කැරකේ" යන මතය පළමුව ඉදිරිපත් කළ මුස්ලිම් විද්වතා,
(1) ඉබ්රාහීම් අල්-බසාරි වේ.
(2) අබූ මහ්ෂර් වේ.
(3) අබූ සඊද් අස්-සන්ජරි වේ.
(4) මුහම්මද් අල්-බීරූනි වේ.
(5) අහමද් අල්-ෆර්කාන් වේ.

**17.** මදීනා හිජ්රාවට ප්‍රධාන අරමුණ ලෙස පිහිටි සාධකය,
(1) ඉස්ලාමයේ පණිවිඩය ප්‍රචාරණය.
(2) කුරෙෂ්වරුන්ගේ හිරිහැරවලින් මුදවාගැනීම.
(3) කුරෙෂ්වරුන්ගේ විරුද්ධාවාදි ක්‍රියා පැරදවීම.
(4) මුස්ලිම්වරුන්ගේ ආර්ථිකය වැඩිදියුණු කිරීම.
(5) ඥාතීන් හමුවීම වේ.

**18.** 'අස්මාඋර්-රිජාල්' යනු,
(1) මුස්ලිම් භූගෝල විද්‍යාඥයින්ගේ ජීවන ඉතිහාසයයි.
(2) හදීස් දැනුම්දෙන්නන්ගේ ජීවන ඉතිහාසයයි.
(3) මුස්ලිම් පාලකයන්ගේ ජීවන ඉතිහාසයයි.
(4) අරාබි අක්ෂර විද්‍යාඥයන්ගේ ජීවන ඉතිහාසයයි.
(5) ඉස්ලාමික නීති ක්ෂේත්‍රයේ විද්වතුන්ගේ ජීවන ඉතිහාසයයි.

**19.** 'උම්මතන් වසතන්' යනු,
(1) උතුම් ප්‍රජාව වේ.
(2) මධ්‍යස්ථ ප්‍රජාව වේ.
(3) සංවර්ධිත ප්‍රජාව වේ.
(4) ආදර්ශමත් ප්‍රජාව වේ.
(5) උගත් ප්‍රජාව වේ.

**20.** 'මස්ලහා' පදනමින් ලබාගත් විනිශ්චයකට හොඳ උදාහරණයකි.
(1) මත්ද්‍රව්‍ය හරාම් වේ යන විනිශ්චය.
(2) ස්ත්‍රීන්ට රත්‍රන් හලාල් වේ යන විනිශ්චය.
(3) මත්පැන් භාවිතයට කස පහරදීම යන විනිශ්චය.
(4) ආෂූරා දිනයේ උපවාස කිරීම.
(5) සිරගෙවල් පිහිටුවීම.

**21.** පහත ප්‍රකාශ අතුරෙන් තජ්දීද් සම්බන්ධ වූ වඩාත් නිවැරදි ප්‍රකාශ තෝරන්න.
A - මුජද්දිද් යන්නන් තමාව තමාම මුජද්දිද් ලෙස ප්‍රකාශයට පත් කරගන්නා අය වේ.
B - ඉමාම් හසනුල් බෂරි (රහ්) තුමා ආරම්භක සමයේ මුජද්දිද් අතරින් කෙනෙකි.
C - මිනිස් යහපත පදනම් කරගෙන, ඉස්ලාම්හි සියලුම අංශවල තජ්දීද් පැවතිය හැකි ය.
D - මුජද්දිද්වරු සියලු ක්ෂේත්‍රයන්හි පාණ්ඩිත්‍ය ලබා තිබීම අනිවාර්ය නොවේ.
(1) A, B (2) A, D (3) A, C (4) B, D (5) B, C

**22.** කෙනෙක් තම භාර්යාව සමග ඇයගේ මවගේ සහෝදරිය හා විවාහවීම තහනම් කර ඇත යන්න සඳහන් වන නීති මූලාශ්‍රය කුමක් ද?
(1) අල්-කුර්ආන්
(2) අල්-හදීස්
(3) අල්-ඉජ්මා
(4) අල්-උර්ෆු
(5) මස්ලහා මුර්සලා

**23.** මාප්පිලෙයි ලෙබ්බේ ආලිම්තුමා ස්ථාපිත කළ අරාබි විද්‍යාලයක් සහ ඔහු විසින් රචනා කරන ලද ග්‍රන්ථයකුත් පෙන්වන වරණය කුමක් ද?
(1) මද්රසතුල් බාරි - තුහ්බතුන් නහ්වූ
(2) මද්රසතුල් මක්කියා - ෆත්හුද්දයාන්
(3) මද්රසතුල් හිල්රියියා - මවාකීදුස්සලාත්
(4) මද්රසතුල් බාරි - ෆත්හුද්දයාන්
(5) මද්රසතුල් මක්කියා - ෂුරූතුස්සලාත්

**24.** පහත දැක්වෙන්නේ හදීස් හා සම්බන්ධ වූ ඇතැම් කරුණු වේ.
A - ඉස්නාදිහි බිඳීමක් සිදු වී තිබීම
B - රාවිවරුන්ගේ අඩුපාඩු පැවතීම
C - අඩු සංඛ්‍යාවක් වූ රාවිවරු විසින් දැනුම් දී තිබීම
D - සහීහ් වූ හදීස්වලට පටහැනිව තිබීම
E - නබිතුමාගේ වෆාතයට ආසන්න සමයේ රිවායත් කර තිබීම
ඉහත සඳහන් කරුණු අතුරින් හදීසයක් ප්‍රතික්ෂේප කිරීමට හේතු වූ කරුණු දැක්වෙන වරණය තෝරන්න.
(1) A, B, C (2) A, B, D (3) A, C, D (4) B, C, D (5) B, D, E

**25.** මුස්ලිම් යුධ සෙබළුන් භාවිත කළ 'කව්සා' යන ආයුධය,
(1) මංජනික් උපකරණය වේ.
(2) ඊතලය වේ.
(3) යකඩෙන් නිම වූ හිස් ආවරණය වේ.
(4) සන්නද්ධ රථය වේ.
(5) කුඩාරම වේ.

**26.** ජාහිලියා කාව්‍ය සංග්‍රහයන් සමහරක් 'මුඅල්ලකාත්' ලෙස හැඳින්වීමට හේතුව,
(1) ඒවා කෑබාහි එල්ලා තිබීම.
(2) ඒවා රන් අක්ෂරවලින් නිර්මාණය කර තිබීම.
(3) ඒවා ප්‍රසිද්ධියට පත්ව තිබීම.
(4) ඒවා තරගවලින් ජයග්‍රහණය කර තිබීම.
(5) ඒවායෙහි ආදරය, වීරත්වය ආදිය ඇතුළත්ව තිබීම.

**27.** මහනුවර රාජධානියේ 'ඔට්ටුපන්තිය' යන දෙපාර්තමේන්තුවට දී තිබූ වගකීම,
(1) ප්‍රවාහනය
(2) වෛද්‍ය අධීක්ෂණය
(3) රාජකීය මුළුතැන්ගෙය
(4) ධීවර අංශය
(5) ආරක්ෂාව

**28.** මිනිසා අල්ලාහ්ගේ නියෝජිතයෙක්ය යන්න හඟවන අරාබි වචනය
(1) හුජ්ජතුල්ලාහ්
(2) රසූලුල්ලාහ්
(3) කලීෆතුල්ලාහ්
(4) කරාමතුල්ලාහ්
(5) වලියුල්ලාහ්

**29.** "ඉස්ලාමීක නීති ක්ෂේත්‍රයේ අරමුණු" අන්තර්ගතවන කොටස් තුන පිළිවෙළින්,
(1) උලූහියියා, වාසිලියියා, උමූමියියා
(2) ළරූරියියා, රබ්බානියියා, හාජියියා
(3) අසබියියා, කව්මියියා, හාෂිමියියා
(4) හාජියියා, ෂුමූලියියා, වාකිඉයියා
(5) ළරූරියියා, හාජියියා, තහ්සීනියියා

● **30** සිට **33** දක්වා සෑම ප්‍රශ්නයකම **X, Y** තීරු යටතේ තොරතුරු දී ඇත. **Y** තීරුවේ ඇති දේ **X** තීරුවේ ඇති දේ සමග කිසියම් හෝ ආකාරයකින් සම්බන්ධ වී ඇත. එහෙත් ඒවා අපිළිවෙළින් පවතියි. **X** තීරුවේ ඇති පිළිතුරට ගැළපෙන පරිදි **Y** තීරුවේ ඇති තොරතුරු ගළපා පිළිවෙළට සකස් කොට නිවැරදි ගැළපුම තෝරන්න.

**30.**

| X | Y |
|---|---|
| 1. නෛසාපූර් | A - මුහම්මද් ඉල්යාස් |
| 2. කූෆා | B - ඉබ්නු රුෂ්ද් |
| 3. කුර්තුබා | C - ඉමාම් මුස්ලිම් |
| 4. කාන්තලා | D - ඉමාම් අබූහනීෆා |

(1) A, C, B, A (2) B, D, A, C (3) C, D, B, A (4) C, B, D, A (5) D, A, C, B

**31.**

| X | Y |
|---|---|
| 1. ශ්‍රී වික්‍රම රාජසිංහ | A - කපිතාන් තාගූර් |
| 2. පළමු බුවනෙකබාහු | B - විනිසුරු රාජකරුණා ගෝපාල |
| 3. කීර්ති ශ්‍රී රාජසිංහ | C - තානාපති අබු උස්මාන් |
| 4. බුවනෙකබාහු | D - මඩිගේ නිලමේ මෞලා |

(1) A, B, C, D (2) B, C, D, A (3) B, A, D, C (4) A, D, C, B (5) B, A, D, C

**32.**

| X | Y |
|---|---|
| 1. අබූ හනිෆා දීනාවාරි | A - තාරකා විද්‍යාව |
| 2. කුවාරිස්මි | B - උද්භිත විද්‍යාව |
| 3. අබූ උබෛදා | C - සත්ත්ව විද්‍යාව |
| 4. අල්-ෆතානි | D - වෛද්‍ය විද්‍යාව |
| 5. ඉබ්නු සීනා | E - ගණිතය |

(1) A, E, C, B, D (2) B, E, C, A, D (3) A, C, B, D, E
(4) B, A, D, C, E (5) C, A, D, E, B

**33.**

| X | Y |
|---|---|
| 1. උමර් (රලි) | A - අමානුල් උම්මත් (සමාජ ආරක්ෂකයා) |
| 2. අස්හාබුස් සුෆ්ෆා | B - නබිතුමා යෙමන් දේශයට යැවූ තානාපති |
| 3. සයිද් බින් සාබිත් (රලි) | C - මජ්ලිසුස්-ෂූරා බිහි කිරීම |
| 4. මුආද් බින් ජබල් (රලි) | D - අධ්‍යාපනයේ දියුණුව සඳහා කැපවීම |
| 5. අබු උබෛදා අල් ජර්රාහ් (රලි) | E - හීබෘ භාෂාවේ පරිචය ලැබුවෙකි |

(1) A, E, B, D, C (2) B, C, A, E, D (3) C, D, E, B, A
(4) D, A, B, C, E (5) E, C, A, D, B

**34.** අබුබක්ර් (රලි) තුමා විසින් සම්පාදිත "මුස්හෆ්", උස්මාන් (රලි) විසින් භාරගන්නා තෙක් ආරක්ෂා කර තැබූ සහාබි මාතාව,
(1) උම්මු සල්මා (රලි) (2) ෆාතිමා (රලි)
(3) අයිෂා (රලි) (4) හෆ්සා (රලි)
(5) සෛනබ් (රලි)

**35.** "පිරිමින් ඉපයූ දේ පිරිමින්ට අයත් ය. ස්ත්‍රීන් ඉපයූ දේ ස්ත්‍රීන්ට අයත්ය" යනු,
(1) අල්-කුර්ආනයේ ප්‍රකාශයකි. (2) නබිතුමාගේ ප්‍රකාශයකි.
(3) ඉජ්මාඃ වූ විනිශ්චයකි. (4) උම්මහාතුල් මුඃමිනීන්වරුන්ගේ අදහසකි.
(5) කාරිජ්වරුගේ මතය වේ.

**36.** පහත සඳහන් ග්‍රන්ථ අතුරෙන් සංගීත කලාව හා සම්බන්ධව ලියූ ග්‍රන්ථය
(1) අල් මුස්තෘමල් (2) ඉක්දුල් ෆරීද්
(3) කිතාබ් අල් මික්යාස් (4) සූරතුල් අර්ල්
(5) තාරීකුල් කබීර්

**37.** ඉස්නාද්හි දැනුම්දෙන්නන්ගේ සංඛ්‍යාව මත පදනම්ව සැකසෙන හදීස් වර්ග පමණක් ඇතුළත් වරණය තෝරන්න.
(1) අල්-මුඅල්ලක්, අල්-මුර්සල්, අල්-ගරීබ් (2) අල්-මුර්සල්, අල්-හසන්, අල්-අසීස්
(3) අල්-මව්කූෆ්, අල් මෂ්හූර්, අල් මක්බූල් (4) අල්-මෂ්හූර්, අල් සහීහ්, අල් ළඊෆ්
(5) අල්-මෂ්හූර්, අල් අසීස්, අල්-ගරීබ්

**38.** අබ්දුල්ලාහ් බින් උරෛකත් නමැත්තා මුස්ලිම් නොවුනත් මුහම්මද් නබි (සල්) තුමාට සහය දුන් සිද්ධිය,
(1) හිල්ෆුල් ෆුදූල් සම්මුතියයි. (2) මදීනා හිජ්රතය වේ.
(3) අබිසීනියානු හිජ්රතය වේ. (4) හුනෛන් යුද්ධය වේ.
(5) හුදෛබියා සම්මුතිය වේ.

**39.** පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) වසර දහයක යුධ නැවැත්වීම යනු මදීනා ගිවිසුමෙහි කොන්දේසිවලින් එකකි.
(2) ලව්හුල් මෑහූල් → බෛතුල් ඉස්සා → ජිබ්රීල් (අලෛ) → මුහම්මද් (සල්) යන පිළිවෙළට අල්-කුර්ආන් වදන් පහළ කර ඇත.
(3) නබිවරුන්ගේ පැමිණීම අවසන් වී ඇති ආකාරයට මුජද්දිද්වරුන්ගේ පැමිණීමත් අවසන් වී ඇත.
(4) අහ්ලුත් තව්හීද් වල්-අද්ල් යන අය මද්හබ් අනුගමනය කරන්නන් වේ.
(5) උමයියා බින් හල්ෆ් මක්කාහි පිළිම වන්දනාව හඳුන්වා දෙන ලදී.

**40.** 'ක්‍රියාවන් සියල්ල අපේක්ෂාවන් මත පදනම් වේ' යන ඉස්ලාමීය නීති ආප්තෝපදේශය දක්වන අරාබි වාග් ශෛලය
(1) අල් - යකීනු ලා යසුලු බිෂ්ෂක්
(2) අල් - උමූරු බිමකාසිදිහා
(3) අල් - ළරූරාත් තුබීහුල් මහ්ලූරාත්
(4) අල් - ළරරු යුඳාලු
(5) අල් - ආදතු මුහ්කමතුන්

**41.** පහත සිද්ධීන් කෙරෙහි අවධානය යොමු කරන්න.
A - දූමතුල් ජන්දල් සිද්ධිය
B - අබ්දුල්ලා බින් සබාගේ කුමන්ත්‍රණය
C - අලි (රලි) සහ අයිෂා (රලි) අතර වූ විරුද්ධවාදිකම්
D - කාරිජ්වරුන්ගේ බිහිවීම
E - උස්මාන් (රලි) තුමාගේ ඝාතනය

ඉහත සිද්ධීන්හි නිවැරදි අනුපිළිවෙළ කුමක් ද?
(1) A, B, C, D, E (2) B, E, C, D, A (3) C, E, A, D, B
(4) B, E, C, A , D (5) B, C, E, A, D

**42.** පහත සඳහන් සටහන් අතුරෙන් තව්වාබීන් පිළිබඳ වඩාත් නිවැරදි සටහන කුමක් ද?
(1) හුසෙයින් (රලි) තුමාව අත්හැරියෙමු යැයි කනස්සල්ලට පත්වූවන් වේ.
(2) හජ්ජාජ් බින් යූසුෆ්ගේ ආධාරකරුවන් වේ.
(3) අබ්දුල් මලික් බින් මර්වාගේ හමුදා සෙබලුන් වේ.
(4) අබ්බාසි කිලාෆතය බිහිකිරීමට ප්‍රබල ලෙස යෙදී සිටි අය වේ.
(5) අලි (රලි) - පාතිමා (රලි) පරම්පරාවේ පවුල් සමාජිකයන් වේ.

**43.** සහීහුල් බුහාරි යන හදීස් ග්‍රන්ථයේ ව්‍යාඛ්‍යානයක් දැක්වෙන කොටස
(1) නෛලුල් අව්තාර් - ඉර්ෂාදුෂ්ෂාරි
(2) අල්-මුඃනි - ෆුතූහුල් කෛබ්
(3) ඉර්ෂාතුෂ්ෂාරි - ෆත්හුල් බාරි
(4) ෆත්හුල් බාරි - ෂරහුල් වරකත්
(5) දාදුල් මආද් - අල් උම්මු

**44.** පහත ප්‍රකාශයන්ගෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) තෆ්සීර්, තෑවීල් යන පද යුගලය අල්-කුර්ආන් විවරණය හා සම්බන්ධ වේ.
(2) ඉජ්තිහාද් කාලය අනුව සීමා කරන ලද කරුණකි. එය සියලුම කාලයන්ට අයත් නොවේ.
(3) මිනිසා තම බුද්ධිය භාවිත කොට ජීවිතයට අවශ්‍ය පදනම හා සංකල්පයන් සකසාගත යුතුය යන්න ඉස්ලාමික මග පෙන්වීම වේ.
(4) මහ්දියා සහ රෆීකා යන නගර කලීෆා හාරුන් රෂීද් තුමා නිර්මාණය කළේය.
(5) මදීනා නගරයට සතුරන් විසින් පහර දෙන විටදී එය ආරක්ෂා කිරීමේ සම්පූර්ණ බලය මුස්ලිම්වරු සතුව තිබේ යන්න මදීනා සම්මුතියේ කොන්දේසියකි.

**45.** නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) අල්-සිකායා, අල් හිජාබා යනු ජාහිලියා සමයේ දක්නට තිබූ විවාහ ක්‍රම දෙකකි.
(2) අස්මා උර්රිජාල් සහ ඉල්මුල් ජරහ් වත්තඅදීල් යන ඉස්ලාමික නීති ක්ෂේත්‍රය හා සම්බන්ධ වූ වචන දෙකකි.
(3) මස්ජිදුල් කුර්තුබා සහ අල්-හම්රා යනු ස්පාඤ්ඤයේ පිහිටා ඇති ගොඩනැගිලි වේ.
(4) ඉමාම් බුහාරි සහ ඉමාම් තිර්මිදි යන දෙදෙනා හදීස් සංග්‍රහයන් 'සහීහෛන්' ලෙස හඳුන්වති.
(5) බුවෛහිද් සහ සෙල්ජුක් උමෛයා සමයේ කුඩා රාජ්‍යයන් වේ.

- අංක **46** සිට **50** දක්වා ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්න අංකයට අදාළ ව දී ඇති ප්‍රකාශ යුගලය සම්බන්ධයෙන් පහත සඳහන් (1), (2), (3), (4), (5) යන වරණවලින් වඩාත් ගැළපෙන යුගලය සහිත වරණය තෝරා එහි අංකය පිළිතුරු පත්‍රයේ සලකුණු කරන්න.

| අංකය | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| (1) | නිවැරදි ය. | නිවැරදි ය. |
| (2) | වැරදි ය. | නිවැරදි ය. |
| (3) | නිවැරදි ය. | වැරදි ය. |
| (4) | වැරදි ය. | වැරදි ය. |
| (5) | නිවැරදි ය. | නිවැරදි වන අතර පළමු ප්‍රකාශය තවදුරටත් විග්‍රහ කෙරේ. |

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| **46.** | කලීෆා මෑමූන්ගේ සමයේ රටේ දියුණුවට මහඟු සේවාවක් සිදුකළේ බර්මිකිවරුන් විසින් ය. | රිසාලත් දැනුමේ මූලාශ්‍රයකි. දාෂ්ඨිය හා තර්කාන්විතභාවය මගින් දැනගැනීමට නොහැකි දේ දැනගැනීමට එය උපකාරී වේ. |
| **47.** | මුස්ලිම්වරුන් අතර ආගමික චින්තන කණ්ඩායම්වල බිහිවීමට තාර්කික චින්තනයන් කාරණයක් විය. | මෞලූආත් වූ හදීස් දොස් තැබීමට මිස ප්‍රතික්ෂේප කිරීමට අවශ්‍ය නොවේ. |
| **48.** | ඉස්ලාමීක දෑවා ඉතිහාසයේ කුරෙෂිවරුන්ගේ ශාරීරික හිංසාවලට ලක්නොවූ කෙනෙකි අබූබක්ර් (රළි) තුමා | ඉස්ලාම් අධිරාජ්‍යයන්ගේ ප්‍රසාරණයේදී අබ්බාසි කලීෆාවරුන්ගේ භූමිකාවට වඩා උමෙයියා කලීෆාවරුන්ගේ භූමිකාව ප්‍රධාන විය. |
| **49.** | අරාබි අර්ධද්වීපයට බාහිරව නබිතුමාගේ දෑවා, හුදෙබියා සම්මුතිය තිබූ කාලයේ ප්‍රබල විය. | සල්මාත් අල්-ෆාරිස් (රළි) නබි මුහම්මද් (සල්) තුමාගේ කිරිමව වූ හලීමාගේ පුතණුවන්ගෙන් කෙනෙකි. |
| **50.** | ඩමස්කස් කෙසුන් කන්දේ නිර්මාණය කොට ඇති කාලගුණ මධ්‍යස්ථානයේ 'අර්-රසම් අල්-මයිමූනි' ලෙස හැඳින්වේ. | රවුම් හැඩයෙන් හා තිත්වලින් ජීව සංකේතවලින් යුත් පහසුවෙන් කියවිය හැකි අරාබි වචන 'අස් සුලුස්' ලෙස හැඳින්වේ. |

***